# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 91 — 1973 දෙසැම්බර් 21 වැනි සිකුරාදා — 1973.12.21

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (IIආ) වැනි ජේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 1823 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | ... |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 1835 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... — | 1838 |
| ඉතාවුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — | විවිධ දැන්වීම ... ... ... | — |


සැළකිය යුතුයි.—(1) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 47 දරණ මුදල් පනත, (2) 1973 අංක 48 දරණ ජාතික ලේඛනාරක්ෂක පනත, (3) 1973 අංක 49 දරණ නිවාස සංවර්ධකයන්ගේ (විශේෂ විධිවිධාන) පනත, (4) 1973 අංක 50 දරණ ලංකා ඛනිජ තෙල් සංස්ථා (සංශෝධන) පනත, (5) 1973 අංක 51 දරණ ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතන (සංශෝධන) පනත, (6) 1973 අංක 52 දරණ ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ (සංශෝධන) පනත, (7) 1973 අංක 53 දරණ කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත හා 1973 අංක 54 දරණ රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර අර්ථසාධක සංගම් (සංශෝධන) පනත යන පනත් දෙසැම්බර් මස 21 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම

### රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ 2, යුනියන් පෙදෙසේ විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය:- තැ. පෙ. 560, කොළඹ) 1974.01.01 සිට 74.12.31 දක්වා දේශීයව නිෂ්පාදනය කළ ලියුම් කවර සැපයීම සඳහා 1974 ජනවාරි මස 17 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් ෆෝරම් කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50 ක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1974 ජනවාරි මස 16 වැනි බදාදා පෙ. ව. 11 වන තෙක් ටෙන්ඩර් ෆෝරම් කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ඇස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1973 දෙසැම්බර් මස 21 වැනි දින,
කොළඹදී ය.

12-713 —1973.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

---

### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

**පිරිපහදු අංශය**

**රබර් කිරි කැපීම සඳහා ටෙන්ඩර්**

සපුගස්කන්ද විජිත්වත් වතුයායේ නිවාස ජනපදයේ රබර් ගස් 700 ක (අලුත් රබර් ගස් 275 ක් ද ඇතුළුව) පමණ කිරි කැපීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින්, සීල් තබන ලද ටෙන්ඩර් මෙයින් කැඳවනු ලැබේ. මෙම වතුයායට යාම පිණිස මෝටර් රථ ගමන් කළහැකි මාර්ගයක් ඇත. තෙල් පිරිපහදුවේ මුදල් අංශයෙහි රුපියල් 50 ක (රුපියල් 40 ක් ආපසු ගෙවනු ලැබේ) තැන්පතුවක් තැබීමෙන් පසු, පහත සඳහන් අයගෙන් ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබා ගත හැක.

1974.01.11 වෙනි දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

ජ්‍යෙෂ්ඨ කාර්යාලයීය ඉංජිනේරු තැන.

තෙල් පිරිපහදුව,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
තැ. පෙ. අංක 11, කැලණිය.

12-727 —1973.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශේෂ නිවේදනයයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ජේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1974 මුදල් වර්ෂය තුළ යාපනය බන්ධනාගාරයට අලුත් මාලු සැපයීම

පහත සඳහන් බන්ධනාගාරයට 1974 ජනවාරි 10 වෙනි දින සිට 1974 දෙසැම්බර් 31 දින දක්වා මස් සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. සැපයිය යුතු ද්‍රව්‍ය පහත එන උපලේඛනයන්ගෙන් බලාගත යුතුයි :—

උපලේඛනය (ඈ)

(i) අලුත් මාලු

(ii) කරවල

3. සියළුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් සහිතව ලියුම් කවරයක දමා සීල් තබා "සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව" කියා එවිය යුතුයි.

එක ටෙන්ඩර් ෆෝර්මයක සඳහන් කළ යුත්තේ එක උපලේඛනයක් සඳහා මිල ගණන් පමණකි.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. රෙජිස්ටර් තැපෑලෙන් නො එවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර්කරුවා විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් හෝ, කොළඹ බන්ධනාගාර මූලස්ථානයේ මූලස්ථාන අධිකාරි ජේ. පී. දෙල්ගොඩ මහතාට භාරදී එය ලැබුණු බවට ලියවිල්ලක් ලබාගත යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර බහාලූ කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ "..................බන්ධනාගාරය.....................උපලේඛනයේ සඳහන් බඩු සැපයීමේ ටෙන්ඩරය" කියා ලියා මෙහි 9 වැනි වගන්තියේ සඳහන් දින පෙරවරු 10.30 ට ප්‍රථම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාට ලැබෙන සේ එවිය යුතුයි. ටෙන්ඩර්කරුවනට වුවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේ දී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. මෙහි 9 වැනි වගන්තියේ සඳහන් ඒ ඒ දිනවල පෙරවරු 10.35 ට කොළඹ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාගේ කාර්යාලයේ දී ඒවා විවෘත කරනු ලැබේ.

6. ටෙන්ඩර් ෆෝර්ම කොළඹ 9, බේස්ලයින් පාරේ පිහිටි බන්ධනාගාර කොමසාරිස්තැනගේ ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැක. නියමිත ෆෝර්මයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ ඒ බන්ධනාගාරය වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට (9 වෙනි ඡේදය බලන්න) පෙර දින ප. ව. 2 දක්වා පමණි.

7. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වූ දින සිට මාස 3 ක් යනතුරු ටෙන්ඩර්කරුවන් තම ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ දිය යුතුයි.

8. ටෙන්ඩර්වල සියළුම වෙනස් කිරීම් සහ මැකීම්වලට ටෙන්ඩර්කරු විසින් තමාගේ කෙටි අත්සන යෙදිය යුතුයි.

9. මෙහි පහත සඳහන් පරිදි, ටෙන්ඩර් පත්‍ර සඳහා මුදල් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ කච්චේරියක (කොළඹ කච්චේරිය හැර) තැන්පත් කොට එම කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ.

යමෙකුට ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 10ක් ඇතුළත කොන්ත්‍රාත්තුවකට හා පොරොන්දුවකට බැඳීමට හෝ අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීමට හෝ නුපුළුවන් වීනි නම්, තැන්පත් කරන ලද මුදල් රාජසන්තක වෙනවාත් සමගම රජය සම්බන්ධව කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නොහැකි වන සේ ඔහුගේ නම, කොන්ත්‍රාත් කඩකරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත.

තවද, කොන්ත්‍රාත්තු කඩ කිරීමේ අලාභ වශයෙන් ලංකාවේ මුදලින් රු. 2,500 ක් රජය වෙනුවෙන් බන්ධනාගාර කොමසාරිස්වරයාට ගෙවීමට එම ටෙන්ඩර්කරුවට සිදුවන්නා ඇත. මෙම අලාභ මුදල නීති මගින් අයකර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස්වරයා වෙත පැවරී ඇත.

ටෙන්ඩර් භාරගත් බව දැක්වෙන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත්, නැති නම් එහි ගෙන ගොස් භාර දුන හොත් එම නිවේදනය ලැබුණු ලෙස සලකනු ලැබේ. අනිත් සියළු තැන්පත් මුදල් කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු දෙනු ලැබේ.

උපලේඛනය (ඈ)

ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල් : රු. 50.

ඇප මුදල : රු. 1,000.

ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා විවෘත කරන දිනය: 1974.1.2.

10. ඉදිරිපත් කරන මිල ගණන් ඉලක්කමෙන් මෙන් වචනයෙන් ද සඳහන් කළ යුතු බවත්, එසේ ම එම ගණන් වචනයේ සඳහන් නොවන ටෙන්ඩර් ප්‍රතික්ෂේප විය හැකි බවත්, ටෙන්ඩර්කරුවන්ගේ විශේෂ සැලකිල්ලට භාජන කරවනු ලැබේ.

11. ටෙන්ඩර් පිළිගැනීමෙන් පසු එසේ පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවන් එම කොන්ත්‍රාත්තුව මනාවින් ඉටු කරන බවට ඔවුන් වෙනුවෙන් ඇප කරුවන් වශයෙන් පෙනී සිටීමට කැමති වගකිව යුතු පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ යුතුය.

12 ඒ ඒ කොන්ත්‍රාත්තුව මනාවින් ඉටු කරන බවට සුදුසු ඇප කරුවන් පොරොන්දු පත්‍රයකින් බැඳීම අවශ්‍යය. තැන්පත් කළ යුතු අවශ්‍ය ඇප මුදල් ප්‍රමාණයන් මෙහි 9 වැනි වගන්තියේ සඳහන් ව ඇත. අවශ්‍ය සියලුම විස්තර මෙම දැන්වීමේ 6 වෙනි ඡේදයේ සඳහන් කාර්යාලයෙන් ලබාගත හැක.

13. ඒ ඒ ටෙන්ඩර් සඳහා ඇති සියලුම කොන්දේසි සම්පූර්ණයෙන් ඉටු වී නොමැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ගැන සලකා බලනු නො ලැබේ.

14. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් හෝ සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කිරීමේ හා ඕනෑම ටෙන්ඩරයක් කොටස් වශයෙන් පිළිගැනීමේ අයිතිවාසිකම් මුළුමනින් ම ටෙන්ඩර් මණ්ඩලය වෙත තබා ගනු ලැබේ.

15 ටෙන්ඩර් මණ්ඩලයේ අවසරය නොමැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් වෙන කෙනෙකුට පැවරීම හෝ අතුරු බදු වශයෙන් දීම හෝ කළ නොහැක. කොන්ත්‍රාත්කරුවකු වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කිරීමේ අයිතිය වෙන කෙනෙකු වෙත පවරමින් දෙන ලද ඇටෝර්නි බලය පිළිනොගෙන නිෂ්ප්‍රභ කිරීමේ බලය රජය සතුය.

16 ඒ ඒ බන්ධනාගාර අධිකාරීන්ට සෑහෙන තරම් කරුණු තිබේ නම්, කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි යොදවනු ලබන යමකු ගැන තම විරුද්ධත්වය ලියවිල්ලකින් දැනුම් දිය හැක. එවැනි කිසිම කෙනෙකු කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි නොයෙදවිය යුතුය. කොන්ත්‍රාත්තුව ඉටු කිරීමේදී කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි යෙදවිය යුත්තේ ලාංකිකයන් පමණකි.

17. මීට ප්‍රථම රජයේ කොන්ත්‍රාත්තුවක් භාර නොගත් ටෙන්ඩර්කරුවෙක් ටෙන්ඩර් පත්‍ර ඉල්ලා සිටීමේදී තම සම්පූර්ණ නම, ස්ථිර ලිපිනය, තමන්ට අයිති ඉඩකඩම් දේපොළ ආදිය පිහිටි දිස්ත්‍රික්කය හෝ කොට්ඨාශය සඳහන් කොට, තමා පදිංචි පළාතේ ආදායම් පාලක තැන විසින් සහතික කරන ලද රිපෝර්තුවක් එවිය යුතුය. දේපොළ විස්තර ද සඳහන් කළ යුතුය.

මීට ප්‍රථම මෙම දෙපාර්තමේන්තුව වෙනුවෙන් කොන්ත්‍රාත්තු ඉටු කරන ලද කොන්ත්‍රාත්කරුවකු කුමන කොට්ඨාශයක හෝ කොට්ඨාශවල එම කොන්ත්‍රාත්තුව තමා ඉටුකර ඇද්දැයි සඳහන් කළ යුතුයි.

18. ශ්‍රී ලංකා ජනරජය වෙනුවෙන් පෙනී සිටින බන්ධනාගාර කොමසාරිස්වරයා සමග කොන්ත්‍රාත්තුවකට අත්සන් තැබිය යුතුය. එබඳු නිලධාරියකුගේ පදවි නාමයෙන් අදහස් කළ යුත්තේ ද ගිණිය යුත්තේ ද, ශ්‍රී ලංකා ජනරජය යටතේ දැනට එම පදවිය දරන්නා වූ නිලධාරියා ද ඔහුගෙන් පසුව එම පදවිය දරන්නා වූ නිලධාරියා ද වේ.

19. මේ පිළිබඳව වැඩි විස්තර බන්ධනාගාර කොමසාරිස්වරයාගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ඒ. ඒ. ද සිල්වා,
වැඩ බලන බන්ධනාගාර කොමසාරිස්.

1973.12.12 වැනි දින,
කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේ දී ය.

12-720 —1973.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

### බන්ධනාගාර දෙපාර්තමේන්තුව

කොළඹ 9, වැලිකඩ බන්ධනාගාරයේ ඇති ගිස්ගෝනි, ටින්, බැරල්, සිමෙන්ති මළු, බෝතල්, කැපීගිය කැන්වස් කැබලි, කැපීගිය ගැල්වනයිස් තහඩු කැබලි සහ සිංහල උළු යනාදිය විකිණීම.

පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් 1974 ජනවාරි මස 11 වෙනි දින උදේ 10.30 දක්වා බන්ධනාගාර කර්මාන්ත අධිකාරී විසින් වැලිකඩ බන්ධනාගාරයේ දී භාරගනු ලැබේ :—

| | | |
|---|---|---|
| (1) | හිස් සිමෙන්ති මළු | 1000 |
| (2) | හිස් තාර බැරල් | 9 |
| (3) | හිස් බැරල් (ගො : 1) | 65 |
| (4) | හිස් බැරල් (ගැ : 5) | 15 |
| (5) | හිස් ටින් (ගැ : 4) | 40 |
| (6) | හිස් ටින් (ගැ : 1) | 40 |
| (7) | හිස් බෝතල | 100 |
| (8) | හිස් ගෝනි | 1,500 |
| (9) | හිස් ලුණු ගෝනි | 50 |
| (10) | කැපීගිය කැන්වස් කැබලි | (තොගයක්) |
| (11) | කැපීගිය ගැල්වනයිස් තහඩු කැබලි | (තොගයක්) |
| (12) | සිංහල උළු | 3,000 |

2. ටෙන්ඩර් සඳහා රු. 50ක මුදලක් මෙම කාර්යාලයේ තැන්පත් කර ටෙන්ඩර් ෆෝරම ලබාගත හැකිය. 1974 ජනවාරි මස 10 වෙනි දින ප. ව. 2 ට පසුව මුදල් භාරනොගනු ඇත. මුදල් තැන්පත් කර ලබාගත් රිසිට්පතද ටෙන්ඩර් පත්‍රයට අමුනා තිබිය යුතුය. තමාගේ ටෙන්ඩර්පත පිළිගත් බව ලිපියකින් දන්වා දින 7 ක් ඇතුළත දී නියම මිළ ගණන් ගෙවා ඉහත සඳහන් බඩු ගෙනයාමට නොහැකිවන හෝ අකමැතිවන අයගේ ටෙන්ඩර් තැන්පත් මුදල් රාජසන්තක කරනු ඇත. ටෙන්ඩරය භාරගත් බව දන්වන ලිපිය කොන්ත්‍රාත්කරු විසින් දී තිබෙන ලිපිනයට තැපැල් කළොත් හෝ ගෙනැවිත් දුනහොත් එය ඔහුට ලැබුණු බවට සලකනු ලැබේ. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් එම බඩු ගෙනයෑමෙන් පසුව ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර්කරු විසින් "ගිස්ගෝනි ආදිය මිළදී ගැනීම" යනුවෙන් කවරයේ වම් කෙළවරේ මුදුනේ සඳහන් කල යුතුය. සිල්තබන ලද ටෙන්ඩර් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. මේ සඳහා මුද්‍රිත ෆෝරම නොමැත.

4. කොළඹ 9, වැලිකඩ බන්ධනාගාරයේ බන්ධනාගාර කර්මාන්ත අධිකාරී තුමාගේ කාර්යාලයේ දී 1974 ජනවාරි 11 වෙනි දින පෙ. ව. 10.35 ට ටෙන්ඩර්පත් විවෘත කරනු ඇත. ටෙන්ඩර්කරුවන්ට ඒ ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

5. මේ සඳහා වැඩි විස්තර අවශ්‍ය නම් පහත සඳහන් අයගෙන් ලබාගත හැක.

ඊ. එල්. පෙරේරා,
බන්ධනාගාර කර්මාන්ත අධිකාරී.

කර්මාන්ත කාර්යාලය,
වැලිකඩ බන්ධනාගාරය,
කොළඹ 9.

12-753 — 1973.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

---

### බන්ධනාගාර දෙපාර්තමේන්තුව

රාගම මහර බන්ධනාගාරයේ ඇති හිස් ගෝනි, සිමෙන්ති මලු, හිස් ටින් යනාදිය විකිණීම

පහත සඳහන් ද්‍රව්‍යයන් මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් 1974 ජනවාරි මස 11 වන දින උදේ 10.30 දක්වා මහර බන්ධනාගාරයේ අධිකාරී විසින් භාරගනු ලැබේ.

| | | |
|---|---|---|
| (1) | හිස් ගෝනි | 1,500 යි. |
| (2) | සිමෙන්ති මලු (හිස්) | 100 යි. |
| (3) | හිස් ගැ. ½ ටින් | 40 යි. |
| (4) | හිස් ගැ. 4 ටින් | 20 යි. |
| (5) | හිස් ගැ. 5 ටින් | 3 යි. |

2. ටෙන්ඩර් සඳහා රුපියල් 25 ක මුදලක් මෙම කාර්යාලයේ තැන්පත් කල යුතුයි. එයට ලබා ගන්නා රිසිට් පත ටෙන්ඩර් පත්‍රය සමග ආපසු (අමුනා) එවිය යුතුයි. තමාගේ ටෙන්ඩරය භාරගත් බව ලිපියකින් දන්වන ලදුව දින 7 ක් ඇතුලත නියම මිල ගණන් ගෙවා ඉහත සඳහන් බඩු ගෙන යාමට නොහැකි වන හෝ අකමැත්ත දක්වන අයගේ ටෙන්ඩර් තැන්පත් මුදල් රාජසන්තක කරනු ලැබේ. ටෙන්ඩරය භාරගත් බව දන්වන ලද ලිපිය ටෙන්ඩර්කරු විසින් දී තිබෙන ලිපිනයට තැපැල් කලොත් හෝ ගෙනැවිත් දුනහොත් එය ඔහුට ලැබුණු බවට සලකනු ලැබේ. භාර ගත් ටෙන්ඩර්කරු විසින් ඒ බඩු ගෙනයෑමෙන් පසුව ටෙන්ඩර තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර්කරු විසින් "හිස් ගෝනි ආදිය" මිලදී ගැනීම යනුවෙන් කවරයේ වම් කෙලවරේ මුදුනේ සඳහන් කල යුතුය. සිල් තබන ලද ටෙන්ඩර් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මේ සඳහා මුද්‍රිත ෆෝර්ම නැත.

4. මහර බන්ධනාගාර අධිකාරී තුමාගේ කාර්යාලයේදී 1974 ජනවාරි 11 වන දින උදේ 10.35 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේ දී පෙනී සිටීමට පුළුවන.

5. මේ සඳහා වැඩි විස්තර අවශ්‍ය නම් පහත සඳහන් අයගෙන් ලබාගත හැක.

සී. ටී. ජැන්ස්,
අධිකාරී, මහර බන්ධනාගාරය.

මහර රාගම බන්ධනාගාරය.

12-752 — 1973.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

---

### ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය—වයඹ දිසාව

නවගත්තේගම කොට්ඨාශය—පුත්තලම

**වතුර පොම්ප සැපයීම සඳහා ටෙන්ඩර පත්**

පහත සඳහන් විස්තරයේ දක්වා ඇති පරිදි වතුර පොම්ප සැපයීම් සඳහා ටෙන්ඩර් පුත්තලම, නවගත්තේගම කොට්ඨාශය, ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු විසින් 1974.01.31 දින පෙරවරු 11 දක්වා භාරගනු ලැබේ :—

"වතුර පොම්ප දෙකයි. විෂ්කම්භය අඟල් 2 යි. අදින නල අඩි 25 යි. සපයන නල අඩි 35 යි. ධාරිතාව පැයකට ගැලුම් 1500/2000 දක්වා. "සැන්ට්‍රිපියුගල්" ස්වයංක්‍රීය වර්ග, ප්‍රොපලය ලෝකඩ, පුට්වැල්ව් සමග වූ සම්පූර්ණ කට්ටල සැපයිය යුතුය. යන්ත්‍රය පිරිතෙල්, ඩීසල් හෝ භූමිතෙල් වලින් ක්‍රියාකරවන්නක් විය හැකිය. යන්ත්‍රය හා පොම්පය වෙන් වෙන් වශයෙන් එකින් එකට සම්බන්ධ විය යුතු අතර එය රාමුවකින් සවිකර තිබිය යුතුය."

2. 1974. 1. 30 දින දහවල් 12 තෙක් පුත්තලම, නවගත්තේගම විධායක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්මයක අනුපිටපතක්ද සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මෙම කාර්යාලයේ හෝ කච්චේරියක හෝ මේ සඳහා රු. 25 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් ෆෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළ හොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

4. සියලු ටෙන්ඩර් කවරයෙහි වම්පස ඉහළ කෙලවරේ "වතුර පොම්ප සැපයීම් සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට පුත්තලම සේවා පාර, නවගත්තේගම විධායක ඉංජිනේරු තැන වෙත යැවිය යුතුය. ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් හෝ පුද්ගලිකව හෝ විධායක ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර් කරුවන් සැපයීම පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කළ යුතුය. පිළිගත් විස්තරයට යම්කිසි වෙනස්වීමක් වේනොත් ඒ බව පැහැදිළිව සඳහන් කළ යුතුය.

6. සාර්ථකවූ ටෙන්ඩර කරුවන් සැපයීම පැහැර හැරියොත් තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නාම ඇතුලත් වන්නේ ය.

7. පුත්තලම සේවා පාරේ, නවගත්තේගම විධායක ඉංජිනේරු කාර්යාලයේ 74.1.31 දින දහවල් 12 ට ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ.

8. කිසියම් ප්‍රශ්ණ කිරීමක් නොමැතිව ටෙන්ඩරයක කොටසක් හෝ ප්‍රතික්ෂෙප කිරීමට හෝ ටෙන්ඩරයේ කොටසක් පිළිගැනීමට අයිතිය රජය සතුවේ.

9. වැඩි විස්තර පුත්තලම, නවගත්තේගම කොට්ඨාශය විධායක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිය.

**පී. ෂන්මුගදාසන්,**
විධායක ඉංජිනේරු, නවගත්තේගම කොටස.

නවගත්තේගම කොට්ඨාශයේ
විධායක ඉංජිනේරු කාර්යාලය,
පුත්තලම,
1973. 10. 30.

**12-584 — 1973.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය**

### කොළඹ වරාය කොමිෂන් සභාව

1974. 01. 01 දින සිට 1974. 12. 31 දින දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවේ වරාය යාත්‍රා අධිකාරි වෙත පහත සඳහන් දෑ සැපයීම සඳහා මුද්‍රා තැබූ ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

"කටුරහිත හරක් මස්"—දිනකට රාත්තල් 120 ක් බැගින් සතිය කට දෙදිනක් නියම කරන පරිදි.

නැවත ලබාගත හැකි රු. 100 ක තැන්පත් මුදලක් ගෙවීමෙන් වැඩි විස්තර හා ටෙන්ඩර් පත්‍ර මෙහි පහත අත්සන්කරුගෙන් ලබා ගත හැක.

2. තෝරා ගත් ටෙන්ඩර්කරු විසින් පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය :—

(i) මස් සැපයීමේ ක්‍රමය අනුමත කරමින් පළාත් පාලන නිලධාරීන් විසින් නිකුත් කරන ලද ලියවිලි.

(ii) කොළඹ නගර සභා සීමාව තුළ ආයතනයකට මස් සැපයීම සඳහා කොළඹ නගර සභාවේ ප්‍රධාන පශු වෛද්‍යවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රය.

3. 1974. 01. 04 වැනි දින දහවල් 12 ට ටෙන්ඩර් භාරගැනීම අවසන් වේ.

එස්. එම්. බී. දොළපිහිල්ල,
වැඩබලන වරාය කොමසාරිස්.

කොළඹ වරාය කොමිෂම,
කොළඹ 1,
1973. 12. 10 දින.

12–708—73.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

---

### කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1974 ජනවාරි මස 24 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 2.30 දක්වා "බැරන්" නමැති තැංගුරම් ටග් යාත්‍රාව විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1974 ජනවාරි මස 24 වෙනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාරගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාරදී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. නැතහොත් ටෙන්ඩර් කරුවන්ට තමන්ගේ ටෙන්ඩර් දෙපාර්තමේන්තු ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව තැන්පත් කළ හැක.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපිලේඛන කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 250 මුදලක් වරාය කොමිෂන් සභා කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇති මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝරම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1974 ජනවාරි මස 22 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝරම කොළ නිකුත් කරනු ලැබේ.

ඇස්. ඇම්. බී. දොලපිහිල්ල,
වැඩබලන වරාය කොමසාරිස් වෙනුවට.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1,
1973.12.11 දින.

12–707—73.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

---

### ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය—දකුණු දිසාව

ගාල්ලේ දකුණු දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් සේවය සඳහා ටෙන්ඩර් පත්, 74. 01. 16 වැනි දින පෙරවරු 10 දක්වා භාරගෙන එම වේලාව ගත වූ වහාම එම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ :—

"ජැස්මින්වැලි අමුණ තැනීම"

2. රුපියල් 50,000 ට වඩා වැය වන කටයුතු සඳහා රජයේ කිසියම් දෙපාර්තමේන්තුවක හෝ රජයේ කිසියම් සංස්ථාවක හෝ මෙම සංවිධානයේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවනට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට මෙම වැඩය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය එසේ ලියාපදිංචි වී ඇති බවට සනාථ කිරීමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. ඔවුන් දැනට කරන මෙම දෙපාර්තමේන්තුවේ වැඩ හා ඒවායේ වටිනාකමත් පිළිබඳ ප්‍රකාශයක් හිනිදුම විධායක ඉංජිනේරු වෙත ඉදිරිපත් කළ යුතුයි.

3. 74. 01. 11 වැනි දින ප. ව. 2 දක්වා හිනිදුම, විධායක ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍රවල පිට පත් දෙකකින් යුත්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලබන්නේ රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් විධායක ඉංජිනේරුට ගෙවූ විට හෝ රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම කාර්යාලයට හෝ ඕනෑම දිසාපති කාර්යාලයකට ගෙවා ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට පමණි.

4. ටෙන්ඩර් පත්‍ර දෙපිටපතකින් යුක්තව, ගාල්ලේ දකුණු දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර බහාලූ කවරයේ සිල් තබා තිබිය යුතු අතර, වැඩයේ විස්තරය එම කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කර තිබිය යුතුය.

5. මෙම වැඩය පිළිබඳ සැලසුම් හා අනිකුත් සියළු තොරතොරු හිනිදුම විධායක ඉංජිනේරු කාර්යාලයෙන් කාර්යාල වේලාවන් තුළදී ලබාගත හැක.

කේ. වෙල්වරාජා,
නියෝජ්‍ය අධ්‍යක්ෂ,
වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

දකුණු දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,
ගාල්ල,
1973. 12. 06.

12–588—73.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

---

### **හිස් සාමාන්‍ය තාර පීප්ප, හිස් වාතෝ තාරපීප්ප සහ හිස් සිමෙන්ති උර විකිණීම හා ඉවත් කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමයි**

වාරිමාර්ග, විදුලි බල හා මහාමාර්ග අමාත්‍යාංශයේ වයඹ දිසාවේ ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සේවා සංවිධානයේ කුරුණෑගල වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් ද්‍රව්‍ය මිලට ගෙන ඉවත්කර ගැනීම සඳහා ලාංකිකයන් ගෙන් සහ ලාංකික ආයතනවලින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ :—

(1) හිස් සාමාන්‍ය තාර පීප්ප.

(2) හිස් වාතෝ තාර පීප්ප.

(3) හිස් සිමෙන්ති කඩදාසි උර.

2. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසාන වනුයේ 1973 දෙසැම්බර් මස 31 වැනි දින පෙරවරු 10 ට වේ. රුපියල් 100ක මුදල් තැන්පත් කොට ලබාගත් ලදුපත් ඉදිරිපත් කිරීමෙන් පසු 1973 දෙසැම්බර් මස 31 වැනි දින පෙ. ව. 9.30 වන තෙක් ටෙන්ඩර් පෝරම ලබාගත හැක. 1973 දෙසැම්බර් මස 31 වැනි දින පෙ. ව. 10. 30ට ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ.

3. කොන්ත්‍රාත්තුව 1974 ජනවාරි මස 01 දින සිට 1974 ජූනි මස 30 වැනි දින දක්වා වූ මාස හයක (06) කාලයකට සීමාවේ.

4. වැඩිදුර විස්තර හා දීර්ඝ ටෙන්ඩර් දැන්වීම් පත්‍ර කුරුණෑගල දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබාගත හැක.

සී. වී. ඒ. සේනාරත්න,
වැඩ අධ්‍යක්ෂ-වයඹ දිසාව.

1973 දෙසැම්බර් 08 වැනි දින,
කුරුණෑගල වයඹ දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ දීය.

12–663—73.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙති.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින්මතු ක්‍රියාත්මක විය හැකි සියලුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධයෙන් ඔහුගේ පත පොත, චැක්රෝල් පොත්, පෙරෙව්වූ පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂාකර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

10. පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින්ම ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

12. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය මාතර, ගොවිපල් පාලනය සහ නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත තබාගනු ලැබේ.

13. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුළත්වූ හෝ තමාට සෑහේ යැයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා විරුද්ධත්වය පලකරන හෝ කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවට බැඳෙනු නොලැබේ.

14. වැඩි විස්තර මාතර ගොවිපල පාලනය හා නිෂ්පාදන කාර්යාලයෙන් හා මිද්දෙනිය, බටඅත, හම්බන්තොට රජයේ ගොවිපල කළමනාකරුගෙන් ද දැනගත හැකිය.

නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ.

පේරාදෙණියේ දී ය.

12-661—73.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා මිල ගණන් කැඳවීම

පහත සඳහන් ගොඩනැගිලි ද්‍රව්‍යයන් සැපයීම සඳහා 1974 ජනවාරි මස 09 දින ප. ව. 2 දක්වා පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සිවිල් ඉංජිනේරු අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් මිල ගණන් කැඳවනු ලැබේ.

1. හොඳින් පුළුස්සන ලද මධ්‍යම ප්‍රමාණයේ හොඳ වර්ගයේ ගඩොල් 3,00,000

2. අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වර්ගයේ 3/4" කැටගල් කියුබ් 40

3. අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වර්ගයේ 1½" කැටගල් කියුබ් 40

4. අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වර්ගයේ 6"×9" සක්කගල් කියුබ් 50

5. අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වර්ගයේ අළුහුණු බුසල් 1,500

6. අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වර්ගයේ නම්බාපු හුණු බුසල් 100

7. අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වර්ගයේ ගංගා වැලි කියුබ් 150

මෙම ද්‍රව්‍යයන් බෙන්තොට ඉදිකෙරෙන අත්හදා බැලීම් මධ්‍යස්ථාන වැඩ බිමට ගෙනැවිත් භාරදිය හැකි හා රජයේ වාහන වලට පටවා දිය හැකි මිල ගණන් වෙන වෙනම සඳහන් කළ යුතුයි.

2. ඉහත සඳහන් ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීමේදී ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ අංක 182හි සංශෝධනය අනුව ගොඩනැගිලි සඳහා අනුමත කරන ලද නියමිත තත්ත්වයන් අනුව තිබිය යුතුය.

3. මෙම ඒක් ද්‍රව්‍යයකට හෝ කොටසකට හෝ සියල්ලටම හෝ මිල ගණන් ඉදිරිපත් කළ හැකිය.

4. මිල ගණන් ආකෘති පිටපත් දෙකකින් යුතුව තමන් විසින් පිළියෙල කර පැහැදිලිව තම මිල ගණන් සඳහන් කර අත්සන් කොට ලියුම් කවරයක බහා සිල් කර සුරක්ෂිතව ලේඛණගත තැපෑලෙන් "සභාපති, සිවිල් ඉංජිනේරු ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය" යන ලිපිනයට 1974 ජනවාරි මස 09 දින ප. ව. 2 ට පෙර ලැබෙන සේ එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "බෙන්තොට අත්හදා බැලීමේ මධ්‍යස්ථානයට ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම" යන්න සඳහන් කළ යුතුය.

5. සියලුම මිල ගණන් අනුමත කරන ලද දිනයේ සිට දින 40 ක කාලයක් ඇතුලත භාර ගැනීම සඳහා වලංගුව තිබිය යුතුයි.

6. ටෙන්ඩර් සියල්ල හෝ කොටසක් හෝ එකක් හෝ පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට සම්පූර්ණ බලය රජය සතුය.

7. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පේරාදෙණියේ අධිකාරී ඉංජිනේරු (සිවිල්) තැනගෙන් අසා දැනගත හැක.

ඇල්. එස්. එස්. ජයසුන්දර,
අධිකාරී ඉංජිනේරු (සිවිල්)
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1973 දෙසැම්බර් මස 05 දින,
පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ
සිවිල් ඉංජිනේරු අංශයේ දීය.

12-553—73.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

---

## ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය—වයඹ දිසාව

### ලොරි, ට්‍රැක්ටර් ට්‍රේලර් හා වෙනත් උපකරණ වලට කුලී ගාස්තු නියම කර ගැනීම හා එක් එක් සේවා සඳහා නියම කරගත් ගාස්තු අනුව කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානයේ වයඹ දිසාවේ වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1974 පෙබරවාරි මස 01 වැනි දින සිට මාස 11ක කාලයක් සඳහා ලොරි, ට්‍රැක්ටර් ට්‍රේලර්, ටිපර් හා පස්වැඩ, කැලෑ සුද්ධ කිරීම් ආදි වෙනත් සේවා සඳහා උපකරණ වලට කුලී ගාස්තු නියම කර ගැනීමට හා නියම කරගත් ගාස්තු අනුව කොන්ත්‍රාත්කරුවන් ලියා පදිංචි කිරීම සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් 1974 ජනවාරි මස 15 වැනි දින පෙ. ව. 10 තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 25ක් වයඹ දිසාවේ වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ හෝ ඕනෑම දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයක හෝ යාපනය, ත්‍රිකුණාමලය හෝ බදුල්ල යන දිසාපති කාර්යාලයක තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1974 ජනවාරි මස 11 වෙනි දින ප. ව. 2 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. මේ සඳහා වැඩි විස්තර කුරුණෑගල, නුවර පාරේ වයඹ දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබා ගත හැක.

ඩී. වී. ඒ. සෝනාරත්න,
වැඩ අධ්‍යක්ෂ, වයඹ දිසාව,
කුරුණෑගල.

වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,
වයඹ දිසාව,
කුරුණෑගල,
1973 දෙසැම්බර් මස 06 වැනි දින දීය.

12-697—73.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### ඩම්පිලෙවලයක් සැපයීම සඳහා ටෙන්ඩර්

පහත දක්වා ඇති විස්තර අනුව ඩම්පිලෙවලයක් සැපයීම සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 1974. 01. 11 දින පෙ. ව. 11 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ. විශේෂ විස්තර පහත දැක්වේ:

සමාන කොටස් 360 කට බෙදූ හුස්ම වෘතයක් සහිත ඩම්පිකල මානය. මෙම උපකරණය සඳහා මූලික දළ මට්ටම් ගැනීම පිණිස වෘත්තාකාර බුබුලක් ද, නියත මට්ටම් ගැනීම සඳහා නළාකාර බුබුලක් ද සැපයිය යුතුය. අවම වශයෙන් අඩි 100 ක් දුරදී අඩි 4 ක දර්ශන පතයක් මෙම උපකරණය තුළින් බැලිය හැකි විය යුතුය. තලමානය සඳහා යෝග්‍ය ශක්තිමත් ආවරණ ධාරකයක් ද (Case) බිම සවි කිරීම සඳහා ආධාරක 3ක් ද, යටිකුරුව අංක යොදන ලද අඩි වලින් බෙදා දක්වන ලද ඇකිලීමට හැකි මට්ටම් ගන්නා මිනුම් දන්ඩක් ද තිබිය යුතුය.

2. ටෙන්ඩර්කරු විසින් සැපයීම කළ යුත්තේ තිබෙන තොගයෙන් කිරුළපනයේ මධ්‍යම ගබඩාවට භාරදීමටත් ය. ටෙන්ඩර්කරුවන් විසින් භාරදිය හැකි ඉතාම කුඩුරු කාලසීමාව සඳහන් කළ යුතුය.

3. 74. 01. 10 වෙනි දින දවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනු පිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කායසීලයේ හෝ කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැනගේ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 50ක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකිවූවන්ගේ ටෙන්ඩර් තැන්පතු මුදල් ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනට හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. සියලු ටෙන්ඩර් කවරයන් හි වම් පස ඉහළ කෙළවරේ "ඩම්පිලෙවලයක් සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි. කවරයෙ වම් පස පහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන්, පුද්ගලික නියෝජිතයකුගේ මාර්ගයෙන් හෝ තමා විසින් හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීතැනට භාරදිය යුතුයි.

6. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාළ නොවිය යුත්තේ ය. ටෙන්ඩර් සලකා බැලීමට ඇති හෙයින් විවෘත කළ දින සිට දින 60ක් යන තෙක් ඒවා ආපසු ගෙන්වා ගත නොහැකිය.

7. ටෙන්ඩර්කරුවන් සැපයීම පිළිබඳව සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කළ යුතුයි. පිළිගත් විස්තරයකට යම්කිසි වෙනස්වීමක් වෙතොත් ඒ බැව් සඳහන් කළ යුතුයි.

8. සාර්ථක වූ ටෙන්ඩර්කරු සැපයිම පැහැර හැරියොත් තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නමද ඇතුළත් වන්නේ ය.

9. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 74.01.11 වැනි දින පෙරවරු 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. කිසියම් ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන්ම හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ ටෙන්ඩරයේ කොටසක් පිළිගැනීමේ අයිතිය රජය සතුය.

11. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු අධිකාරි ඉංජිනේරු තැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

සීපී/2/462,
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය,
කොළඹ, 1973 දෙසැම්බර් 11 වෙනි දින.

12–684—73.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### 1974 මුදල් වර්ෂයේ 1 භාගය තුළ, පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරි යටතේ ඇති ව්‍යාපාරයන් සඳහා ගොඩනැගිලි ඉදිකිරීමේ ද්‍රව්‍ය සැපයීම සඳහා මිළ ගණන් කැඳවීම

පොළොන්නරුව සහ මඩකලපුව දිස්ත්‍රික්කයන් තුළ පිහිටි පහත කාර්යාංශවලට පහත සඳහන් ගොඩනැගිලි ඉදිකිරීමේ ද්‍රව්‍යයන් සැපයීම සඳහා 1974. 1. 4 වැනි දින පෙරවරු 10 දක්වා පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරි විසින් මිළ ගණන් භාරගනු ලැබේ.

පොළොන්නරුව දිස්ත්‍රික්කය.—පිඹුරත්තෑව, අඹගස්වැව, කවුඩුලු වැව අංශ I ජනපද නිවාස ඉදිකිරීමේ අංශය සහ කවුඩුලුවැව II පියවර.

මඩකලපුව දිස්ත්‍රික්කය.—කිරිමච්චෝඩෙයි අංශය.

1. 6"×9" කලුගල් (කියුබ් ගණනින්) ගල්වල ව්‍යාපාරයේ සිට සැ. 5 ක් ඇතුළත් විය යුතුය.
2. $1\frac{1}{2}$" කැටගල් (කියුබ් ගණනින්) ගල්වල ව්‍යාපාරයේ සිට සැ. 5 ක් ඇතුළත් විය යුතුය.
3. 2" කැටගල් (කියුබ් ගණනින්) ගල්වල ව්‍යාපාරයේ සිට සැ. 5 ක් ඇතුළත විය යුතුය.
4. 1" කැටගල් (කියුබ් ගණනින්) ගල්වල ව්‍යාපාරයේ සිට සැ. 5 ක් ඇතුළත් විය යුතුය.
5. $\frac{3}{4}$" කැටගල් (කියුබ් ගණනින්) ගල්වල ව්‍යාපාරයේ සිට සැ. 5 ක් ඇතුළත විය යුතුය.
6. පිලිස්සූ ගඩොල් (1000 බැගින්) පිළිගත් ප්‍රමාණය $8\frac{3}{4}$"×$4\frac{1}{2}$"×$2\frac{3}{4}$"—පෝරණුව ව්‍යාපාරයේ සිට සැ. 5 ක් ඇතුළත විය යුතුය.
7. වියාපූ ඉරුදෙකේ පොල්අතු (1000 බැගින්) සම්මත ප්‍රමාණය 7'×14"
8. ගංගා වැලි (කියුබ් ගණනින්)—ව්‍යාපාරයේ සිට සැ. 5 ක් ඇතුළත සැපයිය යුතුය.
9 අලුහුණු (බුසල් ගණනින්) ගෝනි සමග.
10. තම්බාපු හුණු (බුසල් ගණනින්) ගෝනි සමග.

සැපයීම පිළිබඳ මිලගණන් පහත සඳහන් අයුරු, වෙන්වෙන් වශයෙන් දැක්විය යුතුය:—

(i) පෝරණුවේදී/ගල්වලේදී/වත්තේදී (ලොරිය යාහැකි ස්ථාන විය යුතුය.)

(ii) කාර්යස්ථානයට ගෙනවුත් භාරදීම.

එක් එක් ව්‍යාපාරයක් වෙනුවෙන් රු. 50 බැගින් ඇප වශයෙන් මෙම කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් අනුමත ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට පෙර ඉදිරිපත් කළ යුතුය. 1974 ජනවාරි මස 3 වැනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

මෙම කාර්යාලයෙන් සපයනු ලබන නියමිත ටෙන්ඩර් පෝර්මවල ඉල්ලුම්කළ යුතු අතර, ඒවා ලිපි කවරයක බහා සීල්තබා 1974 ජනවාරි මස 4 වැනි දින පෙ. ව. 10 ට පෙර මෙම කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ ඉඩම් සංවර්ධන නිලධාරි, පොළොන්නරුව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කළ හැකිය. ටෙන්ඩර්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ 'ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර්' යනුවෙන් සඳහන් කළ යුතුය.

1974. 1. 4 වැනි දින ප. ව. 2 ට පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරීන්ගේ කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘතකරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැකිය.

සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඇණවුම් කළ විට ඔහු විසින් සති දෙකක් ඇතුළතදී ද්‍රව්‍ය භාරදිය යුතුය. යමෙකුට එසේ කිරීමට නොහැකි වුවහොත් ඔහුගේ නම කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් වන්නේ ය.

ටෙන්ඩර් ගණනාවක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය, ටෙන්ඩරයක කොටසක් භාරගැනීමේ අයිතිය හා විශේෂ විස්තරයකට අනුකූල නොවූ සැපයීම් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරි සතුය,

තවද වැඩි විස්තර පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරීගෙන් ලබාගත හැකිය.

ඇස්. දිවකලාල,
පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරි.

1973. 12. 08 දින,
පොළොන්නරුව ඉඩම් සංවර්ධන කාර්යාලයේ දී ය.

12–698—73.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

මගේ අංක ඇන් ආර්/ඇස්/38.

**ප්‍රවාහනය කිරීම සහ කම්කරුවන් සැපයීම සඳහා මිලගණන් කැඳවීම.**

වී අලෙවි මණ්ඩලයේ පහත සඳහන් වී ගබඩා වලට ප්‍රවාහනය කිරීම සහ කම්කරුවන් සැපයීම සඳහා, වී අලෙවි මණ්ඩලයේ, කිලිනොච්චිය ප්‍රාදේශීය අධිකාරී විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

| | |
|---|---|
| 1. පූනකරි<br>2. කුනුක්කායි<br>3. කන්ඩාවලෙයි | යාපනය දිස්ත්‍රික්කය. |
| 4. මාංකුලම්<br>5. පූලියංකුලම්<br>6. නෙඩුංකේර්නි<br>7. ඕල්ලියවලෙයි<br>8. මුලතිව් | වවුනියා දිස්ත්‍රික්කය. |

එක් එක් ගබඩාවන් සඳහා රුපියල් 50ක ඇප මුදලක් වී අලෙවි මණ්ඩලයේ කිලිනොච්චිය ප්‍රාදේශීය කාර්යාලයේ තැන්පත් කිරීමෙන් පසුව, ඉල්ලුම්පත් සහ කොන්දේසි ද මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

මිලගණන් කැඳවීම 31. 12. 73 වැනි දින දහවල් 12ට අවසන් වේ.

ඉල්ලුම් පත් 29. 12. 73 වැනි දින දහවල් 12 දක්වා මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

ප්‍රාදේශීය අධිකාරී (උ. ප්‍ර.)
වී අලෙවි මණ්ඩලය, කිලිනොච්චිය.

12–613—73.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

---

**අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව**

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ පිහිටි ප්‍රවාහන අංශයෙහි පාවිච්චි කරන ලද තෙල් ගැලුම් 45 හේ බැරල් 30 ක් විකිණීම සඳහා මිල ගණන් පත්, කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1974 ජනවාරි මස 07 වැනි දින ප. ව. 2 දක්වා භාර ගනු ලැබේ.

2. මිල ගණන් පත් හා අනිකුත් විස්තර කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් 1974 ජනවාරි මස 07 වැනි දින දහවල් 12 දක්වා ලබාගත හැක. මිල ගණන් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එන්. වාමදේව,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1973. 12. 11 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ය.

12–701—73.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

---

**අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව**

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 10, ඩී. ආර්. රෝහල් සැපයීම් අංශයට සහ චුන්නාකම් රෝහල් සැපයීම් අංශයට 1974.12.31 න් අවසන් වන කාලය සඳහා ප්‍රවාහන සේවා සැපයීම පිණිස, කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ, අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 දෙසැම්බර් මස 28 වෙනි සිකුරාදා ප. ව. 2 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ, අලෙවි සංවර්ධන කොමසාරිස් කාර්යාලයේ හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ රු. 100 ක් තැන්පත් කොට ලබාගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් 1973 දෙසැම්බර් මස 28 දින දහවල් 12 දක්වා අවශ්‍ය ටෙන්ඩර් පෝර්ම අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැකිය. ටෙන්ඩර් පත් අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුය.

වැඩි විස්තර අලෙවි සංවර්ධන කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පුළුවන.

එන්. වාමදේව,
අලෙවි සංවර්ධන කොමසාරිස් වෙනුවට.

1973 දෙසැම්බර් මස 10 වෙනි දින,
කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ,
බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ,
අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවේදීය.

12–702—73.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා ජනරජය**

**වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග අමාත්‍යාංශය—මහවැලි සංවර්ධන මණ්ඩලය**

මහවැලි ගංගා සංවර්ධනය—ව්‍යාපාර අංක I
හුරුළුවැව ජල වෘද්ධිය—කොන්ත්‍රාත් අංක I

කන්දලම—හුරුළුවැව ඇළෙහි සැතපුම් 6ක් හා ඊට අනුබද්ධ නිර්මිතින් ඉදිකිරීම පිළිබඳව වූ—හුරුළුවැව ජල වෘද්ධිය—කොන්ත්‍රාත් අංක I සඳහා මහවැලි සංවර්ධන මණ්ඩලයේ සභාපති විසින් මුද්‍රා තැබූ මිල ගනන් මෙයින් කැඳවනු ලැබේ.

සාමාන්‍ය ද්‍රව්‍ය ඝණ යාර 90,000ක් පමණ කැණීම, ඝණ යාර 30,000 පමණ පාෂාණ කැණීම හා බෙදුම් නිර්මිති, දියැලි, ජලාපවහන හරස් පැන්නුම්, මාර්ග බෝක්කු දියමංකඩ, අඩි පාලම් ආදියෙන් යුත් කොන්ක්‍රීට් නිර්මිතීන් 40 ක් පමණ ඉදිකිරීම මෙහි ප්‍රධාන වැඩ අතර වේ. ඇළෙහි කණ්ඩි සඳහා තදකළ පස් ඝණ යාර 65,000ක් පමණ අවශ්‍යවේ.

සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් කටයුතු සාධනය සඳහා අවසර ලබා ඇති රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථාවන් අතර ගැනෙන ‘ රජයේ ඉදිකිරීම් ආයතන ’ හා සිවිල් ඉංජිනේරු ඉදි කිරීම් කටයුතු සාධකය සඳහා රජයේ දෙපාර්තමේන්තු හා සංස්ථාවන් හි රු. 100,000 වැඩියෙන් වන වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ‘ දේශීය කොන්ත්‍රාත් කරුවන් ’ ගෙන්ද මේ සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

